# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## Sabaragamuwa Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය - 2018 | 12 ශ්‍රේණිය

**Third Term Test – 2018** | **Grade 12**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II

**Information and Communication Technology II**

පැය තුනයි

**Three hours**

විභාග අංකය

*මෙම ප්‍රශ්ණ පත්‍රය A සහ B යන කොටස් දෙකකින් යුක්ත වේ. A කොටස සඳහා මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.*

**A කොටස**

01. a) අර්ධාකලකයෙහි හැසිරීම දක්වන සත්‍යතා වගුව ගොඩනගන්න.

b) ඉහත සත්‍යතා වගුව භාවිතයෙන් එහි ප්‍රතිදානයන් සඳහා බූලියානු ප්‍රකාශන ගොඩ නඟන්න

c) ඉහත සත්‍යතා වගුව හා සමීකරණ ඇසුරෙන් අර්ධාකලකයට අනුරූප පරිපථය ගොඩ නඟන්න.

02. මෙහෙයුම් පද්ධතියක් මගින් එහි සම්පත් කළමනාකරණය කරයි.

a) මෙහෙයුම් පද්ධතීන් කාර්යය හා පරිශීලකයින් ගණන අනුව වර්ගීකරණය කරන්න

b) ගොනු කළමනාකරණය සඳහා භාවිතා වන ගොනු පාලන කණ්ඩය සතු උප ලක්ෂණ 04 ක් ලියා දක්වන්න

c) ක්‍රියායන කළමනාකරණයේ දී ක්‍රියායන තත්ව දැක්වෙන සත් ක්‍රියායන තත්ව රූපසටහන ඇඳ නම් කරන්න.

03.a) $100_{10} - 56_{8}$ යන ගැටළුව එකෙහි අනුපූරක ක්‍රමය භාවිතයෙන් විසඳන්න

b) එම ගැටළුව දෙකෙහි අනුපූරක ක්‍රමය භාවිතයෙන් නැවතත් විසඳන්න

c) දත්ත නිරූපණය සඳහා භාවිතා වන කේත ක්‍රමයක් නම් කර, එහි වාසි 02 ලියා දක්වන්න

d) එක්තරා කේත ක්‍රමයක A යන අනුලක්ෂණය සඳහා ලබා දී ඇති අගය 1000001 නම්, CAB යන වචනය එම කේත ක්‍රමයට අනුව නිරූපණය වන ආකාරය දක්වන්න.

04. එක්තරා දුරකථන සමාගමක් තම සේවාව වැඩිදියුණු කිරීම සඳහා තම පාරිභෝගිකයින්ගෙන් ලබාදුන් සේවාව පිළිබඳව ප්‍රතිපෝෂණයන් (feedback) මාර්ගගතව ලබා ගනියි.

a) ඉහත ක්‍රියාවලිය අයත් වන විද්‍යුත් වාණිජ්‍ය ගනුදෙනු වර්ගය කුමක්ද?

b) ඉහත (a) සඳහා ලබා දුන් පිළිතුර එම ගනුදෙනුවේ ප්‍රධාන අවශ්‍යතා සඳහන් කරමින් සාධාරණීකරණය කරන්න.

c) ප්‍රතිවෙන්දේසියක් හා සාම්ප්‍රදායික වෙන්දේසිය සාධක 03 භාවිතයෙන් සසඳන්න

| | |
|---|---|
| | |
| | |
| | |
| | |

d) "අතත්‍ය ප්‍රජාව" යන්න හඳුන්වන්න.